ඇමුණුම **02**

<u>කොන්දේසි</u>

1. වාහන ආනයනය සඳහා ලියාපදිංචි කරන ලද ව්‍යාපාරයක් වීම.
2. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සලකා බලා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳව අවශ්‍යතාව පරිදි ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකිරීමෙන් පසු ලියාපදිංචි කිරීම.
3. ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලියවිලි ව්‍යාජ ලේඛන බවට හෙළි වුවහොත් ඊට අදාල නීතිමය පියවර ගැනීම මෙන්ම අසාදු ලේඛන ගත කරනු ඇත.
4. මෙරටට වාහන ආනයනය කිරීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 5ක පළපුරුද්දක් තිබීම.
5. අවම වශයෙන් සේවකයින් 5 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපාරයක් වීම හා ඔවුන් සේවක අර්ථසාධක අරමුදලෙහි එවක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලෙහි ලියාපදිංචි වී සිටීම හා දායක මුදල් අඛණ්ඩව ගෙවා තිබීම.
6. තම ආයතනය විසින් ආනයනය සඳහා පහසුකම් සැලසීමට බලාපොරොත්තු වන වාහන සන්නාම නාමයන් (Vehicle make) අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර ඉන් බැහැර වෙනත් වාහන ආනයනය නොකළ යුතුය.
7. අනුමත/ සම්මත ක්‍රියාපටිපාටි/ ක්‍රමවේදවලට අනුකූලව, භාවිතා කළ බැටරි බැහැර කරන බවට ආනයනකරු/ අපනයනකරු ලබාදෙන සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය. (ලිපි ශීර්ෂයේ, වගකිව යුතු බලධාරියෙකුගේ මුද්‍රාව සහිත අත්සනින් යුතුව)